රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :8/2005 (IX)

මගේ අංකය: EST-7/ LOANS/04/1040
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2012.07.27

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>**ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තිය සංශෝධනය කිරීම - දේපළ ණය**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2005.03.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2005 සහ එයට සංශෝධන එකතු කරමින් නිකුත් කරන ලද අංක 8/2005 (I) සිට අංක 8/2005 (V) දක්වා වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛ විධිවිධාන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේපල ණය ලබාදීමේ යෝජනා ක්‍රමයෙන් ඉවත් වීමට නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව තීරණය කර ඇති නිසා, රාජ්‍ය නිලධාරීන්ට මුහුණපෑමට සිදුවූ දුෂ්කරතා මගහැරවීම සඳහා පහත සඳහන් පරිදි කටයුතු කිරීමට රජය තීරණය කර ඇත.

I. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මගින් දේපළ ණය අත්තිකාරම් මුදලින් කොටසක් ලබා ඇති නිලධාරීන්ට එම බැංකුව වෙත ඉදිරිපත් කර ඇති ණය අයදුම්පත පදනම් කර ගනිමින් ඉතිරි ණය මුදල් කොටසද එම බැංකුව මගින් ලබාගැනීම.


II. ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම රජයේ නිලධාරීන් නම් එක් අයකු විසින් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙන් දැනටමත් ලබා ගෙන ඇති ණයමුදලින් මිලට ගෙන ඇති ඉඩමේ නිවසක් ඉදි කිරීමට / ඉදිකර ඇති නිවසක් වැඩි දියුණු කිරීමට / අළුතින් කොටසක් එකතු කිරීමට / අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිමකිරීමට, මෙතෙක් රාජ්‍ය සේවක දේපළ ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා නොගත් කලත්‍රයාට නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙන්ම බද්ධ හිණුමක් යටතේ ණය ලබාගැනීම.

III. මින් ඉදිරියට ඉහත IIහි සඳහන් පරිදි හැර රාජ්‍ය නිලධාරීන්ගේ දේපළ ණය අත්තිකාරම් අයදුම්පත් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත ඉදිරිපත් නොකිරීම.

03.	2005.03.31 සිට 2010.01.01 දින දක්වා වූ කාලය තුල රාජ්‍ය සේවක දේපල ණය යෝජනා ක්‍රමයට අදාලව ණය අයදුම්පත් ඉදිරිපත් කර එම ක්‍රමය යටතේ ණය ලබා නොදීම නිසා මහජන බැංකුව හෝ ලංකා බැංකුව හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව හෝ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හෝ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙතින් පුද්ගලිකව දේපළ ණය ලබා ගෙන ඇති නිලධාරීන්ගේ ණය මුදල්, නිලධාරියාගේ ඉල්ලීමක් වෙතොත්, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය නිලධාරීන්ගේ දේපළ ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය මුදලක් සේ සලකා ක්‍රියා කළයුතු වේ.

04.	2005.03.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 හි පරිශිෂ්ට අංක 27 හා 2005.08.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/2005 (III) හි පරිශිෂ්ට අංක 28 මේ සමග ඉදිරිපත් කරනු ලබන ඇමුණුම් 01 හා ඇමුණුම් 02 හි සඳහන් වන අයුරින් සංශෝධනය කරනු ලැබේ.

05.	මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

*ඇමුණුම 01*

# 27 පරිශිෂ්ටය
# බැංකුව විසින් ණය මුදල නිදහස් කළ බව අදාළ අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට දැන්විය යුතු ආකාරය
# (11:4:4 වගන්තිය)

.................................(අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා)

............................................................ (අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව)

**<u>.............................................................................................ගේ ණය මුදල නිදහස් කිරීම</u>**

1. බැංකුව හා බැංකු ශාඛාවේ නම :
2. ණය හිමිකම් අංකය :
3. ණය ලාභියාගේ සම්පූර්ණ නම :
4. 1.ණයලාභියා දැනට දරණ තනතුර :

   11 . ණයලාභියා අයත් සේවාව :

5 ලිපිනය පෞද්ගලික :-

   රාජකාරී :-

6. අනුමත කරන ලද ණය මුදල : රු.……………………… (ඉලක්කමෙන්)

   රු …………………………………… (අකුරෙන්)

7. ණය මුදල අනුමත කළ දිනය :-
8. ණය අයකරනු ලබන කාලසීමාව :-

   වර්ෂය 20...................................සිට 20.........................................දක්වා

9. මාසික ණය වාරිකය :-

   9.1 පොළිය සමග වාරිකයේ වටිනාකම :- රු.

   9.2 ගෙවිය යුතු මුළු වාරික ගණන :-

දිනය :- .......................................

.........................................................

කළමණාකරු

කළමණාකරුගේ නම:

නිල මුද්‍රාව

පිටපත්:- 1............................................................අමාත්‍යාංශය

2. ............................................................(ණයකරු)

# 28 පරිශිෂ්ටය

**ණය ලබාගත හැකි බැංකු නාම ලේඛනය**

(11:11:6)

1. මහජන බැංකුව
2. ලංකා බැංකුව
3. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව